# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.04.03 පැය 1150 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 632/ 2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**ගිනි අවි දෙකක් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාළව 2025.04.02 වන දින සවස් කාලයේ විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රත්ගම පොලිස් වසමේ බූස්ස ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර ඇත.

එහිදී සැකසහිත ලෙස යතුරු පැදියකින් ගමන් ගත් පුද්ගලයෙකු පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල වගර්යේ ගිනි අවියක් හමු වී ඇති අතර එම සැකකරු අත්අඩංගුවට ගෙන ගිනි අවියද සමඟ රත්ගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

සැකකරුගෙන් වැඩිදුර ප්‍රශ්න කර අනාවරණය කර ගත් තොරතුරු මත රත්ගම ප්‍රදේශයේ වැටලීමක් සිදු කර මයික්‍රෝ වගර්යේ පිස්තෝල අවියක් ,09 mm වගර්යේ පතරොමක් හා මැගසිනයක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 60 ක් වන රත්ගම ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ.**

අත්අඩංගුවට ගත් සැකකරු හා සැකකාරිය 2025.04.03 වන අද දින ගාල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිත අතර රත්ගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**